සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 06 - 2023

## බුද්ධ ධර්මය

කාලය පැය 02

නම / විභාග අංකය:

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

### I කොටස

- අංක 01-05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සිදුහත් කුමරා ගිහිගෙය හැරගොස් පැවිදි වූයේ කුමන ගඟකින් එතෙර වීමෙන්ද?
    (i) අනෝමා (ii) නේරංජනා (iii) නිල්වලා (iv) උරුවේලා

02. පෙර අත්බව සිහිකිරීමේ නුවණ යනු,
    (i) ආසවක්ඛය ඤාණය (ii) පුබ්බේනිවාසානුස්සති ඤාණය
    (iii) චුතුපපාත ඤාණය (iv) ජාතිස්මරණ ඤාණය

03. මෛත්‍රී භාවනාවේ ආනිසංසයක් නොවන්නේ,
    (i) සුවසේ නින්දයාම (ii) නපුරු සිහින නොදැකීම
    (iii) මුහුණ පැහැපත් වීම (iv) මරණින් මතු අපායේ ඉපදීම

04. ශික්ෂාකාමී භික්ෂූන් අතර අගතනතුරු ලැබුයේ,
    (i) රාහුල හිමිය (ii) සුනීත හිමිය (iii) ආනන්ද හිමිය (iv) සැරියුත් හිමිය

05. අලීනතාව යනු,
    (i) කම්මැලිකමයි (ii) දැහැමිව ජීවත්වීමයි (iii) කම්මැලි නොවීමයි (iv) නිරෝගී බවයි

- අංක 06-10 වගන්ති නිවැරදි ලෙස යා කරන්න.

| | A | B |
|---|---|---|
| 06. | සඟමිත් තෙරණිය | වෙසක් පෝය |
| 07. | බුදු තෙමගුල | උඳුවප් පෝය |
| 08. | මිහිඳු මා හිමි | ජීවක |
| 09. | දක්ෂ වෛද්‍යවරයෙකි | ඝටීකාර බ්‍රහ්මයා |
| 10. | බෝසතුන්ට පළමුව සිවුරු පූජාකළේ | පොසොන් පෝය |

- අංක 11-15 දක්වා වගන්ති හරි නම් (✓) ලකුණද වැරදි නම් (✗) ලකුණද හිස්තැන මත ලියන්න.

11. අනුන්ගේ දියුණුව දැක සතුටුවීම මුදිතාවයි. ( )
12. අනිත්‍යතාවය යනු වයසට යාමයි. ( )
13. ශ්‍රී ලංකාවේ මුලින්ම පැවිදි වූ කාන්තාව අනුලා දේවියයි. ( )
14. නාලක යනු බුද්ධකාලයේ සිටි දක්ෂ වෛද්‍යවරයෙකි. ( )
15. දුමින්දාගමනය සිදුවූයේ පොසොන් පෝ දිනකය. ( )

**● අංක 16-20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.**
**(කිසාගෝතමී / සඟමිත් තෙරණිය / අරිට්ඨ / භණ්ඩුක / ථූපාරාමය)**

16. ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවූයේ ........................................................................................ යි.

17. මිහිඳු මාහිමි සමඟ වැඩම කළ උපාසක තුමා ........................................................................................ ය.

18. ශ්‍රී ලංකාවේ පළමු භික්ෂූන් වහන්සේ ........................................................................................ ය.

19. අපේ රටේ ඉදිවූ මුල්ම ස්ථූපය ........................................................................................ යයි.

20. නිබ්බුත පද කියන ලද්දේ ........................................................................................ දේවියයි.

# බුද්ධ ධර්මය - 6 ශ්‍රේණිය

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

**01. කෙටි පිළිතුරු ලියන්න.**

(i) යසෝදරා දේවියගේ පියා කවුද?

(ii) සුද්ධෝදන රජතුමාගේ ගුරුවරයාගේ නම ලියන්න.

(iii) බෝසත් කුමරු වප් මඟුල් දින වැඩූ භාවනාව කුමක්ද?

(iv) බුදුබව ලබා පළමුව මගේ රාජ්‍යයට වඩින්නැයි ඉල්ලා සිටි රජතුමා කවුද?

(v) ''සුගන්ධං සීතලං කප්පං'' යන ගාථාව කියා පූජා කරන්නේ මොනවාද?

(vi) රාහුල කුමරු පැවිදි කරවූයේ කවුරුන්ද?

(vii) සීලය දෙයාකාරය. එනම් සමාදානය හා විරමනයයි. සමාදානය යනු කළයුතු නිවැරදි දේය. එසේ නම් විරමනය යනු කුමක්ද?

(viii) ..............................................................................................

..............................................................................................

**මනසා සංවරෝ සාධු**

**සාධු සබ්බත්ථ සංවරෝ**

මෙම ගාථාවෙහි මුල්පද දෙක ලියන්න.

(ix) මිහිඳු මාහිමි සමග වැඩම කළ සාමණේර හිමිගේ නම කුමක්දැයි ලියන්න.

(x) සමනාමයං මහාරාජ .... ගාථාව දේශනා කළේ කවුරුන් කා හටද?

**02.** (i) සම්මා වාචා යනු කුමක්ද?

(ii) වචනයෙන් සිදුවන අකුසල් තුනක් නම් කරන්න.

(iii) සීලයෙහි ආනිසංස 5 ක් ලියන්න.

**03.** (i) හතරවන සිල්පදය හා එහි තේරුම නිවැරදිව ලියන්න.

(ii) ත්‍රිකෝටි පාරිශුද්ධ සීලයට අනුව ඉහත සිල්පදය නම් කරන්න.

(iii) වචනයෙන් සංවර වීම නිසා සිදුවන යහපත වාක්‍ය පහකින් ලියන්න.

**04.** (i) තංච කම්මං කතං සාධු .... ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) එහි තේරුම ලියන්න.

(iii) සුමන මල්කරුගේ කතා පුවත ලියා දක්වන්න.

**05.** (i) ලෝක පරිසර දිනය කවදාද?

(ii) අපට පරිසරයෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න.

(iii) පරිසරය දූෂණය වීම නිසා ඇතිවන ගැටලු 5 ක් ලියන්න.

**06.** (i) ශ්‍රී ලංකාවේ ඉදි කළ මුල්ම පන්සල ලියන්න.

(ii) ශ්‍රී ලංකාවේ මුල්ම ස්තූපය නම් කර එහි නිදන් කර ඇති ධාතූන් වහන්සේ කුමක්දැයි නම් කරන්න.

(iii) මහින්දාගමනය නිසා අපේ රටට උදාවූ ප්‍රතිඵල 5 ක් ලියන්න.

**07.** (i) දැඩි ලෝභය දුකට හේතුවන බව කියවෙන ජාතක කථාවේ නම ලියන්න.

(ii) ශ්‍රද්ධාවන්තයකු තුළ දක්නට ලැබෙන ලක්ෂණ 3 ක් නම් කරන්න.

(iii) මෙම වචන සඳහා භාවිතා වන ශාසනික වචන ලියන්න.

1. අතුගානවා -
2. බුලත්විට -
3. නිදාගන්නවා -
4. ජලය -
5. අතුරුපස -